ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 සැප්තැම්බර් මස 14 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 ජූලි

## සමස්ත නිරීක්ෂණ

| | 2020 ජූලි | 2020 ජනවාරි - ජූලි |
|---|---|---|
| වෙළඳ හිඟය | එ.ජ.ඩො. මිලියන 209<br>2019 ජූලි<br>එ.ජ.ඩො. මිලියන 717 | එ.ජ.ඩො. මිලියන 3,470<br>2019 ජන. - ජූලි<br>එ.ජ.ඩො. මිලියන 4,314 |
| වෙළඳ භාණ්ඩ අපනයන | එ.ජ.ඩො. මිලියන 1,085<br>2019 ජූලි<br>එ.ජ.ඩො. මිලියන 999<br>8.7% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 5,498<br>2019 ජන. - ජූලි<br>එ.ජ.ඩො. මිලියන 6,998<br>-21.4% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | එ.ජ.ඩො. මිලියන 1,294<br>2019 ජූලි<br>එ.ජ.ඩො. මිලියන 1,716<br>-24.6% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 8,968<br>2019 ජන. - ජූලි<br>එ.ජ.ඩො. මිලියන 11,312<br>-20.7% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම**
2020 ජූලි: -
2020 ජන. - ජූලි: එ.ජ.ඩො. මිලියන 956
(-54.9% වාර්ෂික ලක්ෂ්‍යමය)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**
2020 ජූලි: එ.ජ.ඩො. මිලියන 702
(12.2% වාර්ෂික ලක්ෂ්‍යමය)
2020 ජන. - ජූලි: එ.ජ.ඩො. මිලියන 3,682
(-5.5% වාර්ෂික ලක්ෂ්‍යමය)

---

**කොළඹ කොටස් වෙළඳපොළ (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ)**
2020 ජූලි: එ.ජ.ඩො. මිලියන -18
2020 ජන. - ජූලි: එ.ජ.ඩො. මිලියන -129

**රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ)**
2020 ජූලි: එ.ජ.ඩො. මිලියන -23
2020 ජන. - ජූලි: එ.ජ.ඩො. මිලියන -515

**දළ නිල සංචිත**
2020 ජූලි අග - එ.ජ.ඩො. බිලියන 7.1
(ආනයනික මාස 4.8)

**විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්)**
2019 දෙසැ. අග - 181.6340
2020 ජූලි අග - 185.6769













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

වෙළඳ භාණ්ඩ ආනයන වියදම අඩුවීම හමුවේ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ ජූලි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් යථා තත්ත්වයට පත් විය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද, කැපී පෙනෙන වර්ධනයන් කිහිපයක් නිරීක්ෂණය කරන ලදී. වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ ජනවාරි සිට ප්‍රථම වරට ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා ගිය අතර, 2020 වසරේ පෙබරවාරි මාසයෙන් පසු ප්‍රථම වරට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම් තවදුරටත් ක්‍රියාත්මක වීම හමුවේ අපේක්ෂා කළ පරිදි වෙළඳ භාණ්ඩ ආනයන පහළ මට්ටමක පැවතියේය. 2020 වසරේ ජූලි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබුණු අතර, එය 2018 ජනවාරි මාසයේ සිට වාර්තා වූ ඉහළ ම මාසික ප්‍රේෂණ ප්‍රමාණයයි. මේ අතර, 2020 වසරේ ජූලි මාසය අවසානය වන විට ඉන්දියානු සංචිත බැංකුව වෙතින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය (SAARCFINANCE) යටතේ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ලැබීමත් සමඟ රටේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.1ක් දක්වා ඉහළ ගියේය. දේශීය විදේශ විනිමය වෙළඳපොළට ශුද්ධ ලැබීම් වාර්තා වීම හමුවේ විනිමය අනුපාතිකය මත වූ පීඩනය ලිහිල් වූ අතර, දළ නිල සංචිත ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට ද හැකි විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් සාපේක්ෂව අඩු මට්ටමකින් වුව ද විදේශීය ආයෝජන ගෙවීම් වාර්තා විය. 2020 වසරේ ජූලි මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 ජූලි එ.ජ.ඩො. මිලියන | 2020 ජූලි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- ජූලි එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- ජූලි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 999 | 1,085 | 8.7 | 6,998 | 5,498 | -21.4 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,716 | 1,294 | -24.6 | 11,312 | 8,968 | -20.7 |
| වෙළඳ ශේෂය | - 717 | -209 | | - 4,314 | -3,470 | |
| සංචාරක ඉපැයීම් | 218 (ආ) | - | - | 2,119 (ආ) | 956 (ඇ) | -54.9 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 626 | 702 | 12.2 | 3,895 | 3,682 | -5.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 44 | -18 | | 34 | -129 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 110 | 91 | | 5,665 | 1,297 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 40 | 1 | | 417 | 91 | |
| දිගුකාලීන ණය | 70 | 90 | | 849 | 1,206 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 4,400 | - | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 255 | 192 | |
| සමස්ත ශේෂය | | | | 1,490 | -939 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- **වෙළඳ ගිණුමේ හිඟය** 2019 වසරේ ජූලි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 717 සිට 2020 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 209ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 509කින් අඩු වූ අතර, මේ සඳහා අපනයන ඉහළ යෑම සහ ආනයන පහත වැටීම හේතු විය. එලෙසම, සමුච්චිත වශයෙන් සැලකීමේදී වෙළඳ හිඟය 2019 වසරේ ජනවාරි-ජූලි කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,314 සිට 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 3,470ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 844කින් අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 01 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ ජූලි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.1කින් පහත වැටුණු අතර, ආනයන මිල ගණන් පහත වැටීමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහත වැටීම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2020 ජනවාරි - ජූලි කාලය තුළ වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : (එ.ජ. ඩො. මිලියන)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




**මූලය** : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- දේශීය මෙන්ම ගෝලීය වශයෙන් ද සැපයුම් සහ ඉල්ලුම් දාම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ අපනයන ආශ්‍රිත කර්මාන්ත සඳහා රජය දැක් වූ සහයෝගය හේතුවෙන් **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම 2019 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 894 සිට 2020 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,085ක් දක්වා අඛණ්ඩව වර්ධනය විය. පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ ජූලි මාසයේ දී සියයට 8.7කින් වර්ධනය විය. 2020 වසරේ පෙබරවාරි මාසයට පසුව ප්‍රථම වරට මෙම ධනාත්මක වර්ධනය වාර්තා වූ අතර, මේ සඳහා කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ යන ප්‍රධාන අපනයන කාණ්ඩ තුනෙන් ම වූ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය.
- පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. සකස් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති සියලු උප කාණ්ඩවල අපනයන ඉහළ ගියේය. 2020 වසරේ ජූලි මාසයේ දී තේ අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි මාසයටත් වර්ධනය වූ අතර, මේ සඳහා 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව සාමාන්‍ය තේ අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව ඉහළ යෑම හේතු විය. කුළුබඩු යටතේ වර්ග කර ඇති සියලුම උපකාණ්ඩවල අපනයන පරිමාව ඉහළ යෑමත් සමග කුළුබඩු අපනයන ආදායම ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන මිල ගණන් ඉහළ යෑම සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් පොල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් පුවක් අපනයනය ඉහළ යෑම හේතුවෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මෙයට ප්‍රතිවිරුද්ධව, මුහුදු ආහාර අපනයන ආදායම පහත වැටුණු අතර, මේ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය වැනි මුහුදු ආහාර සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත වෙතින් වූ ඉල්ලුම අඩුවීම හේතු විය.

- 2020 වසරේ පෙබරවාරි මාසයට පසුව ප්‍රථම වරට කාර්මික අපනයන ආදායම 2020 වසරේ ජූලි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ආහාර, පාන වර්ග හා දුම්කොළ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, සත්ත්ව ආහාර, රබර් නිෂ්පාදිත සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. වෙනත් නිමකල රෙදිපිළි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති මුහුණු ආවරණ සහ ආරක්ෂිත ඇඳුම් වැනි පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑම හමුවේ 2020 වසරේ ජූලි මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 1.4කින් සුළු වශයෙන් පමණක් පහත වැටුණු අතර, එම පහත වැටීමට ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වෙත අපනයනය කරන ලද ඇඟලුම්වලින් ලද ආදායම පහත වැටීම හේතු විය. මේ අතර, ටයර් අපනයනය සුළු වශයෙන් පහත වැටුණ ද, ප්‍රධාන වශයෙන් ශල්‍ය හා වෙනත් අත් වැසුම් අපනයනය ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. 2020 වසරේ ජූලි මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, මූල ලෝහ හා උපාංග සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ ඇතුළු කාර්මික අපනයන යටතේ වර්ගකර ඇති වෙනත් උප කාණ්ඩවල අපනයන ආදායම පහත වැටුණි.
- 2020 වසරේ ජූලි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඛනිජ අපනයන ආදායම ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් යපස්, යබොර හා අළු මෙන්ම පාෂාණ හා ගල් වර්ග අපනයන ආදායම ඉහළ යෑම ද මේ සඳහා හේතු විය.
- 2020 වසරේ ජූලි මාසයේ දී අපනයන පරිමා දර්ශකය සියයට 26.1කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 13.8කින් පහත වැටුණි. මෙමඟින් 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේදී අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාව ඉහළ යෑම මුළුමනින් ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | ජූලි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජූලි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූලි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.-ජූලි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **789.5** | **819.4** | **3.8** | **5,518.1** | **4,176.5** | **-24.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.7 | 64.3 | 75.4 | 270.0 | 262.2 | -2.9 |
| සත්ත්ව ආහාර | 10.0 | 18.7 | 87.2 | 80.7 | 67.9 | -15.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 475.6 | 469.2 | -1.4 | 3,237.0 | 2,413.0 | -25.5 |
| එයින් ඇඟලුම් | 443.4 | 404.3 | -8.8 | 3,014.2 | 2,138.5 | -29.1 |
| රෙදිපිළි | 23.1 | 26.5 | 14.9 | 161.0 | 132.4 | -17.8 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.1 | 38.3 | 319.2 | 61.8 | 142.1 | 130.1 |
| රබර් නිෂ්පාදිත | 76.3 | 82.2 | 7.8 | 518.4 | 417.9 | -19.4 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.7 | 17.7 | -28.3 | 175.6 | 90.5 | -48.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 36.0 | 32.0 | -11.2 | 242.5 | 178.4 | -26.4 |
| ප්‍රවාහන උපකරණ | 7.2 | 8.2 | 13.6 | 114.5 | 39.1 | -65.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 43.0 | 26.7 | -38.0 | 285.0 | 246.2 | -13.6 |
| රසායනික නිෂ්පාදිත | 15.5 | 16.6 | 7.3 | 103.4 | 91.9 | -11.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.2 | 10.9 | 7.4 | 80.9 | 55.4 | -31.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 0.7 | 6.3 | 831.7 | 24.0 | 21.4 | -11.0 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.3 | 6.4 | 1.5 | 64.4 | 32.5 | -49.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.2 | 22.2 | 255.0 | 42.6 | 48.9 | 14.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 16.4 | 10.1 | -38.5 | 107.1 | 65.5 | -38.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.7 | 2.4 | -9.4 | 16.8 | 11.5 | -31.5 |
| වෙනත් කාර්මික අපනයන | 22.1 | 25.5 | 15.6 | 155.2 | 134.3 | -13.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **205.1** | **261.2** | **27.3** | **1,450.2** | **1,300.1** | **-10.3** |
| තේ | 111.3 | 130.9 | 17.6 | 796.3 | 702.6 | -11.8 |
| රබර් | 1.9 | 2.9 | 49.7 | 16.9 | 16.4 | -3.3 |
| පොල් | 30.9 | 40.8 | 32.2 | 204.1 | 187.6 | -8.1 |
| කුළුබඩු | 26.5 | 40.9 | 54.6 | 170.1 | 154.8 | -9.0 |
| එළවළු | 2.5 | 7.1 | 187.8 | 18.5 | 21.0 | 13.7 |
| සකස් නොකළ දුම්කොළ | 2.8 | 2.5 | -11.0 | 19.4 | 12.0 | -38.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.8 | 17.5 | 98.4 | 61.1 | 88.2 | 44.4 |
| මුහුදු ආහාර | 20.4 | 18.5 | -9.4 | 164.0 | 117.6 | -28.3 |
| **3. ඛනිජමය අපනයන** | **2.7** | **2.9** | **7.4** | **19.4** | **12.6** | **-35.0** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.3** | **1.6** | **24.7** | **10.1** | **8.6** | **-14.9** |
| **මුළු අපනයන** | **998.5** | **1,085.0** | **8.7** | **6,997.7** | **5,497.8** | **-21.4** |

(අ) තාවකාලික

***මූලයන්:*** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරීත්වය

- 2020 වසරේ මාර්තු මාසයේ සිට පැවති ආනයන වියදම පහත වැටීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2020 වසරේ ජූලි මාසයේ දී **වෙළඳ භාණ්ඩ ආනයන වියදම** පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,294ක් දක්වා සියයට 24.6කින් පහත වැටුණි. 2020 වසරේ ජූලි මාසයේ දී සියලුම ප්‍රධාන ආනයන අංශවල වියදම පහත වැටුණි. ආනයන වියදම පහත වැටීම සඳහා රජය විසින් තෝරාගත් භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ද හේතු විය.
- 2020 වසරේ ජූලි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර, ඒ සඳහා ඉන්ධන (සියයට -36.3කින්) සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග (සියයට -20.7කින්) ආනයන වියදම පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඉන්ධන ආනයන වියදම පහත වැටීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් පහත වැටීම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් සහ බොර තෙල් ආනයන වියදම අඩුවීම හේතු විය. බොරතෙල් බැරලයක් සඳහා සාමාන්‍ය ආනයන මිල පෙර වසරේ අනුරූප මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 68.73ට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේ දී එ.ජ.ඩොලර් 46.23ක් දක්වා පහත වැටුණි. 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේ දී පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව ද පහත වැටුණු අතර, බොරතෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාව ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් රෙදි වර්ග සහ නූල් වර්ග ආනයනය පහත වැටීම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහත වැටුණි. තවද, 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේදී අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම උප කාණ්ඩවල ආනයන වියදම ද පහත වැටුණි.
- 2020 වසරේ ජූලි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එහි උප කාණ්ඩ සියල්ලෙහිම අඩු වීමත් සමඟ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, ආනයන වියදම් අඩු කිරීම සඳහා රජය විසින් පනවනු ලැබූ සීමා කිරීම් ඒ සඳහා හේතු විය. මේ අනුව, 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ (ප්‍රධාන වශයෙන් ඉංජිනේරු උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, විදුලි සංදේශ මෙවලම් සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස්), ගොඩනැගිලි ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ සහ ඒ ආශ්‍රිත උපාංග, ප්ලාස්ටික්, රබර් හා වීදුරු භාණ්ඩ සහ සිමෙන්ති) සහ ප්‍රවාහන උපකරණ (ප්‍රධාන වශයෙන් ටැංකි, බවුසර හා ත්‍රිරෝද රථ වැනි වාණිජ අරමුණු සඳහා යොදාගනු ලබන රථ වාහන) ආනයන වියදම පහත වැටුණි.
- ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. ආනයන සීමා කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස, විදුලි සන්දේශ මෙවලම් (ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන) සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත හැර අනෙකුත් සියලුම උප කාණ්ඩවල ආනයනය වියදම පහත වැටීමත් සමඟ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය පහත වැටුණි. 2009 වසරේ දෙසැම්බර් මාසයට පසුව අඩුම මාසික රථවාහන ආනයන වියදම වාර්තා කරමින් 2020 වසරේ ජූලි මාසයේ දී පෞද්ගලික රථවාහන ආනයන

වියදම සියයට 93.6කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතර, 2020 වසරේ ජූලි මාසයේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් සීනි, මේද වර්ග හා තෙල් වර්ග (ප්‍රධාන වශයෙන් පොල් තෙල්) සහ එළවළු (ප්‍රධාන වශයෙන් පරිප්පු) ආනයන ඉහළ යෑම හේතු විය.

- 2020 වසරේ ජූලි මාසයේ දී ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය යන දර්ශක දෙක ම පිළිවෙලින් සියයට 16.1කින් සහ සියයට 10.1කින් පහත වැටුණි. මෙමගින් 2019 වසරේ ජූලි මාසයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයේදී ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමාව සහ ආනයන මිල ගණන් යන සාධක දෙකම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | ජූලි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජූලි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූලි 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.-ජූලි 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **356.0** | **289.6** | **-18.7** | **2,167.1** | **2,071.7** | **-4.4** |
| ආහාර හා පාන වර්ග | 109.3 | 130.2 | 19.1 | 799.2 | 917.5 | 14.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.0 | 1.3 | -57.2 | 19.3 | 18.0 | -6.7 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 26.5 | 24.8 | -6.2 | 178.1 | 205.9 | 15.6 |
| එළවළු | 23.8 | 25.6 | 7.8 | 165.1 | 228.0 | 38.1 |
| මුහුදු ආහාර | 20.5 | 19.3 | -5.6 | 127.7 | 126.8 | -0.7 |
| සීනි හා රසකැවිලි | 9.0 | 27.7 | 206.4 | 113.4 | 144.1 | 27.1 |
| කුළුබඩු | 11.3 | 8.5 | -25.1 | 61.4 | 76.2 | 24.1 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 15.2 | 23.0 | 50.7 | 134.2 | 118.5 | -11.7 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 246.8 | 159.4 | -35.4 | 1,367.9 | 1,154.2 | -15.6 |
| පෞද්ගලික රථවාහන | 95.4 | 6.1 | -93.6 | 419.6 | 279.5 | -33.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 50.4 | 63.0 | 24.9 | 299.6 | 337.7 | 12.7 |
| ගෘහ මෙවලම් | 16.1 | 8.8 | -45.4 | 113.7 | 91.8 | -19.3 |
| රෙදිපිළි හා උපාංග | 21.9 | 13.4 | -38.7 | 156.0 | 124.4 | -20.3 |
| විදුලි සංදේශ මෙවලම් | 26.0 | 45.6 | 75.1 | 141.2 | 146.9 | 4.1 |
| ගෘහ හා දැව භාණ්ඩ | 15.4 | 10.6 | -30.7 | 90.7 | 81.1 | -10.5 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 21.5 | 11.8 | -45.1 | 147.1 | 92.8 | -37.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **969.6** | **734.3** | **-24.3** | **6,516.0** | **4,901.1** | **-24.8** |
| ඉන්ධන | 314.7 | 200.3 | -36.3 | 2,315.6 | 1,443.7 | -37.7 |
| එයින්, බොරතෙල් | 94.1 | 67.0 | -28.9 | 585.4 | 318.3 | -45.6 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 220.5 | 130.6 | -40.8 | 1,604.9 | 996.2 | -37.9 |
| ගල්අඟුරු | 0.1 | 2.8 | 4140.3 | 125.3 | 129.2 | 3.1 |
| දියමන්ති හා අගනා ගල් වර්ග | 21.4 | 10.3 | -51.9 | 109.5 | 49.5 | -54.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 248.6 | 197.1 | -20.7 | 1,643.4 | 1,262.8 | -23.2 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 42.3 | 33.8 | -20.1 | 253.5 | 208.9 | -17.6 |
| කෘෂිකාර්මික යෙදවුම් | 19.4 | 16.1 | -16.8 | 113.8 | 117.9 | 3.6 |
| තිරිඟු හා ඉරිඟු | 35.1 | 26.8 | -23.7 | 178.5 | 183.3 | 2.7 |
| මූල ලෝහ | 47.1 | 36.4 | -22.8 | 324.6 | 207.6 | -36.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 55.0 | 46.6 | -15.2 | 344.9 | 275.0 | -20.3 |
| රසායනික නිෂ්පාදිත | 75.2 | 74.1 | -1.5 | 486.7 | 453.0 | -6.9 |
| පොහොර | 12.0 | 9.1 | -24.3 | 105.3 | 116.1 | 10.2 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 21.2 | 18.6 | -12.2 | 130.0 | 128.8 | -0.9 |
| ඛනිජ නිෂ්පාදිත | 17.3 | 14.8 | -14.4 | 125.7 | 93.3 | -25.8 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 60.4 | 50.3 | -16.8 | 384.3 | 361.2 | -6.0 |
| **3. ආයෝජන භාණ්ඩ** | **389.9** | **269.1** | **-31.0** | **2,625.5** | **1,984.3** | **-24.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 193.5 | 157.0 | -18.8 | 1,425.8 | 1,147.0 | -19.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 148.8 | 94.2 | -36.7 | 874.2 | 589.3 | -32.6 |
| ප්‍රවාහන උපකරණ | 46.8 | 17.7 | -62.2 | 321.3 | 246.2 | -23.4 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.9 | 0.3 | -71.3 | 4.1 | 1.7 | -57.6 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **0.7** | **77.6** | **3.4** | **11.2** | **231.9** |
| **මුළු ආනයන** | **1,715.9** | **1,293.7** | **-24.6** | **11,311.9** | **8,968.3** | **-20.7** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,401.3** | **1,093.4** | **-22.0** | **8,996.3** | **7,524.6** | **-16.4** |

(අ) තාවකාලික

**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම සඳහා ගුවන් තොටුපොළ සහ වරායන් වසා තිබීම හේතුවෙන් 2020 වසරේ ජූලි මාසයේ දී අඛණ්ඩව හතරවන මාසයටත් **සංචාරක පැමිණීම්** කිසිවක් වාර්තා නොවීය. එමනිසා, 2019 වසරේ පළමු මාස හත තුළ දී පැමිණි 1,124,150ක සංචාරකයින් ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 වසරේ පළමු මාස හත තුළ සමුච්චිත සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් ලෙස පැවතුණි.
- ඒ අනුව, සංචාරක පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු කෙරෙන **සංචාරක ඉපැයීම්** 2020 වසරේ පළමු මාස හත තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 54.9ක අඩුවීමකි.
- මේ අතර, පෙර වසරේ ජූලි මාසය හා සැසඳීමේ දී 2020 ජූලි මාසයේ දී **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 702ක් දක්වා සියයට 12.2ක අඛණ්ඩ වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, සමුච්චිත පදනම මත සැලකූ විට, 2020 වසරේ ජනවාරි-ජූලි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 3,682ක් දක්වා 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට සියයට 5.5කින් අඩු විය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2020 වසරේ ජූලි මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 23ක විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා වීමත් සමඟ, සමුච්චිත පදනම මත, 2020 වසරේ ජනවාරි-ජූලි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 515ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ ජූලි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 69ක් ලෙස අඩු මට්ටමක පැවතුණි.
- 2020 වසරේ ජූලි මාසයේ දී **කොළඹ කොටස් වෙළඳපොළෙහි** ද්විතීයික වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 18ක ශුද්ධ ගෙවීම් වාර්තා විය. 2020 ජූලි මාසයේ දී ප්‍රාථමික වෙළඳපොළ වෙත ලැබීම් වාර්තා නොවීය. සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස හත තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 129ක ශුද්ධ ගෙවීමක් (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ දෙකම ඇතුළත්ව) වාර්තා කළේය.
- මේ අතර, 2020 වසරේ ජූලි මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන ණය** එ.ජ. ඩොලර් මිලියන 101ක ශුද්ධ ගෙවීමක් ද වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- ඉන්දියානු සංචිත බැංකුව වෙතින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය යටතේ වූ එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම ලැබීමත් සමඟ 2020 වසරේ ජූලි මස අවසානය වන විට **දළ නිල සංචිත** ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.1ක් දක්වා වැඩි වූ අතර, එය ආනයනික මාස 4.8ක් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ ජූලි මස අවසානය වන විට මාස 6.8ක ආනයන ආවාරණය කරන පරිදි එ.ජ. ඩොලර් බිලියන 10.0ක් විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට අඛණ්ඩව අතිප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2020 ජූලි මාසයේ දී ද එම ප්‍රවණතාව ම පවත්වා ගනිමින් සියයට 0.3ක සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. 2020 වසරේ අප්‍රේල් මස මැද සිට පැවති තියුණු අතිප්‍රමාණය වීම සමඟ 2020 වසරේ සැප්තැම්බර් 14 වැනි දින දක්වා වූ කාලය තුළ දී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි සමස්ත අවප්‍රමාණය සියයට 1.6කට සීමා විය. දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම් සිදු කරන ලදී. 2020 වසරේ අගෝස්තු මස අවසානය දක්වා වූ කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 200.4ක් අවශෝෂණය කර ගන්නා ලදී. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසර මුල සිට සැප්තැම්බර් මස 14 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල, යුරෝ, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (සැප්. 14 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -1.6% |
| යුරෝ | -12.7% | +2.6% | -6.9% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | +0.8% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -3.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -5.3% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +1.4% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව